## දෙවන වාර පරීක්‍ෂණය* 2018
## මතුගම අධ්‍යාපන කලාපය

| නාට්‍ය හා රංග කලාව i | 11 | කාලය පැය 01 යි |
|---|---|---|

නම/විභාග අංකය --------------------------------- පන්තිය --------

සැලකිය යුතුයි

- සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න
- අංක 1-40 තෙක් දී ඇති (1) (2) (3) (4) පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා ඔබට සැපයෙන උත්තර පත්‍රයේ නියමිත ප්‍රශ්න අංකයට හිමි උත්තරයෙහි අංකය හා සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න. මුළු ලකුණු (40×1- 40) යි

---

පහත දැක්වෙන ගීත කොටස් ඇසුරෙන් 1-5 දක්වා ප්‍රශ්න වලට පිළතුරු සපයන්න

A දන්න වංහුං අපෙ
කන්දසාමි රාජදූරයේ

B මුහුදු පතුල යට ඉඳලා
මුතු ඇටයක නිදි කරලා

C ලප නොමවන් සඳ සේ සොම් ගුණෝනා
ආදර දිනනා සිසු සැවොමා

D පෙර සිට පැවත එන
සිරිතට පොදිය බැඳගෙන
උරපිට තබාගෙන....

E දීකිරි දීකිරි ගෙනාව දීකිරි
මිහිපිට කාටත් ගුණ දෙන දී කිරි

(1) “රතු හැට්ටකාරී’’ නාට්‍යයේ එන ගීත ඛණ්ඩය වන්නේ
(1) A (2) B (3) C (4) E

(2) C වලින් දැක්වෙන ගීත ඛණ්ඩය අයත්වන්නේ
(1) සිංහබාහු නාට්‍යයටය (2) රතු හැට්ටකාරී නාට්‍යයටය
(3) මනමේ නාට්‍යයටය (4) රාමායණය නූර්තියටය

(3) D වලින් දැක්වෙන ගීත ඛණ්ඩය අයත්වන්නේ
(1) ශාන්ති කර්ම වලටය (2) කෝළම් වලටය (3) නාඩගම් වලටය (4) ටීටර් වලටය

(4) නූර්ති ගීත ඛණ්ඩයක් වන්නේ
(1) A (2) B (3) C (4) E

(5) ඊ වලින් දැක්වෙන ගීත ඛණ්ඩය අයත්වන නාට්‍යය
(1) නල දමයන්ති (2) මූදු පුත්තු (3) කරදිය (4) හෙලේ නැග්ග ඩෝං පුතා

(6) උඩරට ප්‍රදේශයට ආවේණික ශාන්ති කර්මය තෝරන්න
(1) කොහොඹා කංකාරිය (2) පහන් මඩුව(3) ගම්මඩුව (4) සූනියම් යාගය

(7) එකම කතා පුවතක් ආශ්‍රය කර ගනිමින් නිරූපණය කරන ජන නාට්‍ය කලාවකි
(1) සොකරි (2) නාඩගම් (3) කෝළම් (4) ශාන්ත කර්ම

(8) දේශීය ජන නාට්‍යය විශේෂයක් වන කෝළම් එම නමින් හඳුන්වනු ලැබුවේ
(1) චරිත වලට අනන්‍ය වූ නර්තන ශෛලියක් තිබීම නිසාය
(2) වෙස් මුහුණු පැළඳ නැටීම නිසාය
(3) සමාජයේ දුබලතා හාස්‍යයට උපහාසයට ලක් කළ නිසාය
(4) විනෝදාස්වාදය පරමාර්ථ කොට රඟ දැක්වූ නිසාය

(9) අඹ විදමන, මරා ඉපැද්දීම, දෙවොල් ගොඩ, බැසීම යන නාට්‍යමය පෙළපාලි දැකිය හැකි වන්නේ
(1) මඩු ශාන්ති කර්ම වලය (2) කොහොඹා කංකාරියේය
(3) සන්නියකුමේය (4) කෝළම් වලය

(10) නාට්‍ය සංගීතය අයත් වන්නේ
(1) වාචික අභිනයටය (2) අහාර්ය අභිනයටය
(3) ආංගික අභිනයටය (4) අභිනය සතරටමය

(11) ලෝක නාට්‍ය දිනය යෙදී තිබෙන්නේ කවදාද?
(1) මාර්තු 02 (2) මාර්තු 27 (3) මැයි 01 (4) පෙබරවාරි 14

(12) රූපණ ශිල්පියෙකු වශයෙන් හැඩ ගැසීමේදී ආධුනික ගති ලක්ෂණ නැතිකර ගැනීමට සුදුසුම ක්‍රමය වන්නේ
(1) වේදිකා නාටයය නැරඹීමයි
(2) නාට්‍ය කලාව පිළිබඳ ලියවුණු පොත්පත් හැකිතාක් කියවීමයි
(3) රංග අභ්‍යාස වල නිරත වීමයි
(4) විවිධ තේමාවන් ඔස්සේ නාට්‍ය පිටපත් ලිවීමයි

(13) නාට්‍යමය අවස්ථාවක් යනු
(1) නාටයයක කතාපුවතයි (2) කතා පුවත තුළ පවතින විවිධ අවස්ථායි
(3) ප්‍රතිවිරුද්ධ ක්‍රියාවලින් හෝ චරිත දෙකක් අතර පවතින ගැටුමයි
(4) වේදික පසුතල වෙනස් කරමින් වේදිකාව මත මවන අවස්ථාවයි

(14) මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ නාට්‍යය පමණක් ඇතුළත් වරණය තෝරන්න
(1) මනමේ, කදා වළලු, හස්ති කාන්ත මන්තරේ, දුන්න දූනු ගමුවේ
(2) මනමේ, කදා වළලු, ඒකට මට හිනා හිනා, මහාසාර,
(3) සිංහබාහු, බෙරහඬක්ෂඩ, රත්තරං, කදා වළලු,
(4) සිංහබාහු, රත්තරං, සුබ සහ යස, හව කඩතුරාව

15 -20 දක්වා ප්‍රශ්න වල අදාළ නොවන ප්‍රකාශය තෝරන්න

(15) රංග අභ්‍යාස වල නිරත වීමෙන්
(1) සතුටක් ලැබිය හැක (2) සබකෝලය නැති වේ
(3) සිසුන් අතර අන්තර් සබඳතා නැති වේ (4) පෞරුෂය වර්ධනය වේ

(16) අභිරූපණය සම්බන්ධයෙන් නොගැලපෙන ප්‍රකාශය කුමක්ද
(1) සැබෑ ලෝකයේ ද්‍රව්‍ය කිසිවිටක පාවිච්චි නොකරයි
(2) මුහුණ වෙස් මුහුණක් ලෙස අංග රචනය කරයි
(3) විනාඩි 5-10 අතර කාලයකට සීමා වේ
(4) චරිතයේ ස්වභාවයට අනුව ඇඳුම් භාවිතා කරයි

(17) ක්ෂණික නිරූපණයක් සම්බන්ධයෙන් වැරදි ප්‍රකාශය තෝරන්න
(1) ක්ෂණිකව ලැබෙන මාතෘකාවකට අනුව ඉදිරිපත් කරන නිරූපණ අවස්ථාවක්
(2) පිටපතක් සහිතව ඉදිරිපත් කරණු ලබන්නක්
(3) කේවල හෝ සාමූහික වශයෙන් ඉදිරිපත් කරයි
(4) නාට්‍යෝචිත අවස්ථාවක් මෙන්ම කතාවක් ප්‍රකාශ විය යුතුය

(18) චරිත සම්බන්ධව නිවැරදි  නොවන ප්‍රකාශය තෝරන්න
(1) පිටපතෙහි ඇති කතාව ප්‍රේක්ෂකයා වෙත ප්‍රදර්ශනය වන්නේ චරිත මගිනි
(2) චරිත ඉවත් කළ විට කතාවක් දැකිය නොහැක
(3) චරිතයක පවතින්නේ එක් භූමිකාවකි
(4) සෑම නාට්‍යයකම චරිත තිබේ

(19) නාඩගම් නාට්‍ය කලාව සම්බන්ධයෙන් අදාළ නොවන ප්‍රකාශය තෝරන්න
(1) අංග සම්පූර්ණ නාට්‍ය පිටපතක් තිබුණි
(2) ගැහැණු චරිත පිරිමි විසින් ඉදිරිපත් කරණු ලැබීය
(3) පොතේ ගුරුගේ චරිතයක් දක්නට ලැබුණි
(4) නාට්‍යය පැය තුනකට සීමා විය

(20) නාට්‍ය හා ප්‍රේක්ෂකයා අතර පවතින සහ සම්බන්ධය පෙන්නුම් නොකරන කරුණ කුමක්ද?
(1) නාට්‍යයක් නැරැඹීම සඳහා විශේෂයෙන් සූදානම්ව පැමිණෙන පුද්ගලයා ප්‍රේක්ෂකයාය
(2) ප්‍රේක්ෂක ප්‍රතිචාර නාට්‍යයකට අවශ්‍යම අංගයකි
(3) ප්‍රේක්ෂකයා නොමැති නම් නාට්‍යයක් නැත
(4) නාට්‍ය දර්ශනයකට ප්‍රේක්ෂකයා අවශ්‍යම පුද්ගලයෙක් නොවේ

පහත දැක්වෙන ඡායාරූප ඇසුරෙන් 21-31 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න






1 2 3 4

(21) ඉහත පළමු රූපයෙන් දැක්වෙන නාට්‍යකරුවා වන්නේ
(1) ජයලත් මනෝරත්න (2) ආර්.ආර් සමරකෝන්
(3) ගාමිණී හත්තොට්ටුවේගම (4) සුගතපාල ද සිල්වා

(22) ඉහත දෙවන රූපයෙන් දැක්වෙන නාට්‍යකරුවා වන්නේ
(1) ජයලත් මනෝරත්න (2) ආර්.ආර් සමරකෝන්
(3) ගාමිණී හත්තොට්ටුවේගම (4) සුගතපාල ද සිල්වා

(23) ඉහත තෙවන රූපයෙන් දැක්වෙන නාට්‍යකරුවා වන්නේ
(1) ජයලත් මනෝරත්න (2) ආර්.ආර් සමරකෝන්
(3) ගාමිණී හත්තොට්ටුවේගම (4) සුගතපාල ද සිල්වා

(24) ඉහත සිව්වන රූපයෙන් දැක්වෙන නාට්‍යකරුවා වන්නේ
(1) ජයලත් මනෝරත්න (2) ආර්.ආර් සමරකෝන්
(3) ගාමිණී හත්තොට්ටුවේගම (4) සුගතපාල ද සිල්වා

(25) ''ලෙඩක් නැති ලෙඩෙක්" නම් නාට්‍ය නිෂ්පාදනය කරමින් නාට්‍ය ක්ෂෙත්‍රයට අවතීර්ණය වූයේ
(1) ජයලත් මනෝරත්න (2) ආර්.ආර් සමරකෝන්
(3) ගාමිණී හත්තොට්ටුවේගම (4) සුගතපාල ද සිල්වා

(26) පීඩිත පන්තියේ දැවෙන ප්‍රශ්න වේදිකාවට ගෙන එමින් හා සංගීතය නාට්‍යයට අත්‍යවශ්‍යම නොකර ගත් නාට්‍යකරුවා වන්නේ
(1) ජයලත් මනෝරත්න (2) ආර්.ආර් සමරකෝන්
(3) ගාමිණී හත්තොට්ටුවේගම (4) සුගතපාල ද සිල්වා

(27) නාට්‍ය රචකයෙකු නිෂ්පාදකයෙකු මෙන්ම රංගන ශිල්පියෙකු වශයෙන් ද දස්කම්පා තිබෙන්නේ
(1) ජයලත් මනෝරත්න (2) ආර්.ආර් සමරකෝන්
(3) ගාමිණී හත්තොට්ටුවේගම (4) සුගතපාල ද සිල්වා

(28) සංස්කෘතික දෙදරීම හා හෝදූ පාළුව ගැන තේමා කරගෙන නාට්‍ය නිර්මාණයෙහි යෙදුන නාට්‍යකරු වන්නේ
(1) ජයලත් මනෝරත්න (2) ආර්.ආර් සමරකෝන්
(3) ගාමිණී හත්තොට්ටුවේගම (4) සුගතපාල ද සිල්වා

(29) දේශපාලනික ආර්ථික හා සාමාජීය අංශ විවේචනය තුළින් ජනතා වාදී නාට්‍ය කලාවක් බිහිකරලීම සඳහා පුරෝගාමී වූ නාටයකරුවා වන්නේ
(1) ජයලත් මනෝරත්න (2) ආර්.ආර් සමරකෝන්
(3) ගාමිණී හත්තොට්ටුවේගම (4) සුගතපාල ද සිල්වා

(30) ඉහත ඡායා රූප වලින් දැක්වෙන නාට්‍යකරුවන් විසින් නිෂ්පාදනය කරන ලද නාට්‍ය පිළිවෙලින් නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න
(1) අහසින් වැටුණු මිනිස්සු, පුත්‍ර සමාගම, නීතියේ කන්‍යාව, බෝඩිංකාරයෝ
(2) අහසින් වැටුණු මිනිස්සු, පුත්‍ර සමාගම, බෝඩිංකාරයෝ, නීතියේ කන්‍යාව
(3) පුත්‍ර සමාගම, අහසින් වැටුණු මිනිස්සු, බෝඩිංකාරයෝ, නීතියේ කන්‍යාව
(4) නීතියේ කන්‍යාව, අහසින් වැටුණු මිනිස්සු, පුත්‍ර සමාගම, බෝඩිංකාරයෝ,

(31) නාඩගම්, නූර්ති, පරිවර්තන හෝ අනුවර්තන යන නාට්‍ය වර්ග වලට අයත් නාට්‍යය පිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න
(1) ලියනෝරා, රාමායණය, ජන හතුරා, තට්ටු ගෙවල්
(2) තට්ටු ගෙවල්, ලියනෝරා, රාමායණය, ජන හතුරා,
(3) ලියනෝරා, රාමායණය, තට්ටු ගෙවල්, ජන හතුරා,
(4) රාමායණය, ලියනෝරා, තට්ටු ගෙවල්, ජන හතුරා,

(32) දික්තල කාලගෝල නාට්‍යය රචනා කරන ලද්දේ කවර සම්ප්‍රදායකට අනුවද?
(1) ස්වභාවික සම්ප්‍රදාය (2) ලෝකධර්මී සම්ප්‍රදාය
(3) තාත්වික සම්ප්‍රදාය (4) නාට්‍යධර්මී සම්ප්‍රදාය

(33) සතර අභිනය ගැන මුලින්ම සඳහන් වන්නේ
(1) ඇරිස්ටෝටල්ගේ කාව්‍ය ශාස්ත්‍රයේය
(2) භරතමුණිගේ නාට්‍යය ශාස්ත්‍රයේය
(3) ධනංජයගේ දශ රූපයෙහිය
(4) ලියෝ ටෝල්ස්ටෝයිගේ කලාව යනු කුමක්ද කෘතියෙහිය



1



2

(34) ඉහත පළමු රූපයෙන් දැක්වෙන දර්ශනය ඇතුළත් නාට්‍යය වන්නේ,
(1) සිංහබාහු. (2) මනමේ.
(3) නරිබෑණා. (4) දික්තල කාලගෝල

(35) ඉහත දෙවන රූපයෙන් දැක්වෙන දර්ශනය ඇතුළත් නාට්‍යය වන්නේ,
(1) සිංහබාහු. (2) මනමේ.
(3) නරිබෑණා. (4) දික්තල කාලගෝල

(36) නාට්‍ය ධර්මී නාට්‍යය සම්බන්ධයෙන් වැරදි ප්‍රකාශය තෝරන්න
(1) නාට්‍ය ධර්මී නාට්‍යය රිද්මයානුකූල වේ
(2) නාට්‍ය ධර්මී නාට්‍යය සඳහා විවිධ ජන මූලාශ්‍ර වල නාද තාල පද යොදා ගනී
(3) නාට්‍ය ධර්මී නාට්‍යය වල පසුතලය වාචිකව විස්තර කෙරේ
(4) ගීත අඩංගු වන්නේ නාට්‍ය ධර්මී ශෛලියට අයත් නාට්‍යය වල පමණයි

(37) රංග භූමියේ කල්පිත බෙදීම සම්බන්ධ වැරදි ප්‍රකාශය තෝරන්න
(1) වටකුරු වේදිකාවේ කල්පිත බෙදීම පින්තූර රාමු වේදිකා බෙදීමට වඩා වෙනස්ය
(2) වටකුරු වේදිකාවේ ප්‍රේක්ෂකයාට සමීපතම ස්ථානය ලෙස සැලකෙන්නේ වේදිකාවේ හරි මැදයි
(3) නූතන රංග භූමිය ප්‍රධාන වශයෙන් කොටස් 9 යකට බෙදේ
(4) වේදිකාවේ වම දකුණ ලෙස සැලකෙන්නේ ප්‍රේක්ෂකයා වේදිකාවට මුහුනලා සිටින විට ඔහුගේ වම් අත හා දකුණු අත පිහිටන පැත්තය

(38) රූපයේ දැක්වෙන රංගාලෝක උපකරණය යොදා ගන්නේ
(1) පොදුවේ මුළු වේදිකාවම ආලෝක කිරීම සඳහාය
(2) ගගනිකාව හෙවත් වේදිකාවේ පසුපස තිරය ආලෝක කිරීම සඳහාය
(3) සමූහයක් අතරින් පුද්ගලයෙක් විශේෂයෙන් පෙන්වීම සඳහාය
(4) ක්ෂණිකව වර්ණ වෙනස් කිරීම සඳහාය



(39) රූපයේ දැක්වෙක රංගාලෝක පහන හඳුන්වන නම
(1) අල්ට්‍රාවයලට් ලාම්පු (2) ධාරා පහන්
(3) වර්ණ චක්‍රය (4) ස්ට්‍රිප් ලාම්පු

(40) වර්මානයේ භාවිතා නොවන රංගාලෝක උපකරණය කුමක්ද?
(1) අල්ට්‍රාවයලට් ලාම්පු (2) ස්ට්‍රිප් ලාම්පු
(3) කිට්සන් පහන් (4) ධාරා පහන්